# නාට්‍ය උදෙසා නර්ථනය





කුසුම්සිරි සහ යශෝධරා
ලියනාරච්චි සරච්චන්ද්‍ර

**අප** සැම දන්නා පරිදි නාට්‍ය වූකලී සාමූහික ක්‍රියාවලියකි. එනම් රචක, අධ්‍යක්ෂක, නලු නිළියන්ට අමතරව සංගීත, නැටුම්, අංග රචනා, රංග වස්ත්‍ර, පසුතල, රංගාලෝක, වේදිකා පරිපාලන ආදී බොහෝමයක් වූ පාර්ශවයන්ගේ ඒකභාසුවකි. තවත් ලෙසකින් කියතොත් කලාවන් රැසකගේ සංකලනයකි. අද අපේ අවධානය නාට්‍ය නම් අපූර්ව කලා මාධ්‍යයේ නිර්මාණයන් පෝෂණය කර ගැනීම උදෙසා නර්ථන කලාවේ ඇසුර ලැබිය හැකි අයුරු පිළිබඳවය.

කෙතරම් දක්ෂ සංගීතඥයකු වුවද නාට්‍ය පෙළ අවබෝධයෙන් තොරව ඊට සංගීතය නිර්මාණය කිරීම සමස්ථ නාට්‍යයේ අසාර්ථක භාවයට කෙසේ සහය වෙයිද නර්ථනයද එසේම වන්නේය. කෙතරම් උගත්, දක්ෂ නර්ථන ශිල්පියකු වුවද කම් නැත. නාට්‍යයකට නර්ථනය නිර්මාණය කිරීම වූ කලී තරමක වෙනස් කර්තව්‍යයකි.

මුලින්ම නාට්‍ය පෙළ, චරිත පිළිබඳව නර්තන නිර්මාණ ශිල්පියා තුළ අවබෝධයක් ඇති කර ගත යුතුය. අධ්‍යක්ෂකවරයා සමඟ සාකච්ඡා කොට අධ්‍යක්ෂකවරයාගේ අවසන් රූපය පිළිබඳව වටහා ගත යුතුය. මේ සියල්ල පරිපූර්ණ කොට ගත්තද ඔහු නිර්මාණශීලී පුද්ගලයකු නොවෙයි නම් ප්‍රතිවිපාක සමස්ථ කෘතියම අත්විඳිනු ඇත. නාට්‍ය පෙළට උචිත වන නර්ථන සම්ප්‍රදායන්, ශෛලීන්ගේ ඇසුර ලබා ගැනීමේ හැකියාව නර්ථන නිර්මාණ ශිල්පියා සතුවිය යුතුය. සෑම නාට්‍යයකටම නර්ථනය අවශ්‍ය නොවන්නේය. නාට්‍ය පෙළට අනුව එම කෘතියට නර්ථනය අවශ්‍යද නැද්ද යන්න වටහා ගැනීම මුලින්ම සිදුකල යුත්තකි.

නාට්‍ය පෙළට අනුව ඊට නර්ථනය අවශ්‍ය වන්නේ නම්, කතා පුවත බටහිර සමාජයේ සිදුවන පුවතක් නම්, චරිත බටහිර සමාජයේ ජීවත් වන චරිත නම් මෙවන් පසුබිමකදී නර්ථන නිර්මාණ ශිල්පියා ඇසුරු කර ගන්නා ශෛලිය, සම්ප්‍රදාය කුමක් විය යුතුද? ශ්‍රී ලාංකික ජන සමාජය පසුබිම් වන කතා පුවතක් දිවෙන නාට්‍යයකදී බැලේ නර්ථනයන් ඇසුරින් නර්ථන නිර්මාණය කිරීම නොගැලපෙන්නේද?

මෙවන් පැණියන් සඳහා සපයන පිළිතුරු ඉතා පුද්ගල බද්ධය. එය මෙසේ විය යුතුයයි කිසිවකුට නීති පැණවිය නොහැකිය. අපි සැම දැන හඳුනන .ජසයා සහ ලෙන්චිනා කතා පුවත රැගත් ගැමි නාටකයක් උදෙසා අයෙක් භාරත නාට්‍යම ඇසුරෙන් නර්ථනය නිර්මාණය කිරීම අපට විකාරයක් සේ දිස් වුවද තවකෙකුට එය ඉතා නිර්මාණශීලී දෙයක් බවට පත්විය හැකිය. මෙය පුළුල් විවාදාත්මක මාතෘකාවකි.

කෙසේ නමුත් ලාංකික අපි නිර්මාණය කරන නාට්‍යයකට නර්ථනය අවශ්‍ය නම් ඒ උදෙසා අපේ නර්ථන කලාවන්ගේ ඇසුර, ආභාෂය ලැබීමේ හැකියාව ඇත.

අපේ නර්ථන කලාවන් කියූ සැනින් මැවෙන රූපය උඩරට, පහතරට, සබරගමු යන නැටුම් සම්ප්‍රදායන් ත්‍රිත්වයයි. මේ සම්ප්‍රදායන් ත්‍රිත්වය ඉතා පොහොසත් මෙවලම් වලින් හෙබි නර්ථන සම්ප්‍රදායන් බව අවිවාධාත්මක යැයි සිතමු. ඒ පිළිබඳව පසු ලිපි පෙළකින් කරුණු දක්වාලීමට ඉඩ තබමු.

පසුගිය දශක කිහිපය පුරාවට ලාංකික සිංහල නාට්‍ය උදෙසා මේ නර්ථන සම්ප්‍රදායන්ගේ ඇසුර ලැබී ඇති අවස්ථා අපමණය. මෙල්බර්න් නුවරවාසීන්හට සමීපත වූ මහාසාර නාටකයේ මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නිෂ්පාදනයෙන් නිදසුන් කීපයක් දක්වමු. සරච්චන්ද්‍රයන් අධ්‍යක්ෂණය කළ මහාසාර නාටකයේ සිටුතුමාගේ ප්‍රවිශ්ඨය වූ කලී පහතරට බෙර වාදනයකට අනුකූලව සිදුවූ නර්ථනයකි. (මෙල්බර්න් හි සිදුවූ නිෂ්පාදනයේ එවන් නර්ථනයන් වූයේද නොදනිමු) එම සරල නර්ථනය වූ කලී සිටු චරිතයේ පෞරුෂය විදහාලන ආකාරයට නිර්මාණය කර තිබුනකි. ඒ නර්ථනයෙන් සිටුතුමා වේදිකා-වට ප්‍රවිශ්ඨ වී වටයක් යාමේදී කිසි විටෙක සිටුතුමා නට නටා යන්නේය යන හැඟීමක් ජනිත නොවූ අයුරු මතකය. ඒ නර්ථනය තුළින් චරිතය විදහාලීමක් සිදුවිය. දක්ෂ නිර්මාණශීලි නර්ථන නිර්මාපකයකුගේ හැකියාව ඒ තුළ ගැබ් වී තිබිණ. එහිදී නාට්‍ය හෝ චරිතය අභිබවා නර්ථනය ඉස්මතුවීමක් හෝ නර්ථනය නිසා චරිතයට හානියක් සිදුවීමක් නොපෙනින. එය සාර්ථකවත් සමබරවත් කළ සංකලනයක් විය.

එම නිර්මාණ ශිල්පියා ඒ සාර්ථකත්වය දිනා ගත්තේ ඔහු තුළ වූ නිර්මාණශීලීත්වය මෙන්ම පහතරට නර්ථන සම්ප්‍රදාය පිළිබඳව වූ දැනුම නිසාය. පහතරට කෝලම් සම්ප්‍රදායේ එන මුදලි කෝලමින් ආභාෂය ලබමින් සිටුවරයාගේ චරිතයට අදාළ නර්ථන නිර්මාණය කර තිබූ ආකාරය අපූරුජනක විය.

මහාසාර නාටකයේම තවත් නිදසුනකි නාට්‍ය ආරම්භයේදී වේදිකාවට පිවිසෙන වැඳිරියගේ චරිතය විසින් ඉදිරිපත් කළ යුතු නර්ථන කොටසක් විය. චරිතයට අදාළව නව නිර්මාණ ලෙසින් නිර්මිත යම් යම් නර්ථන කොටස් ගැබ් වූවා සේම ඒ සඳහා දොළහ පෙළපාලියේ පැමිණෙන .සඳපාළියෙන්. නර්ථන ආභාෂය ලබාගෙන නිර්මිත නර්ථනාංගයන්ද විය. වැඳිරියගේ චරිතය නාට්‍යයට අදාළව ඉස්මතු කරලිය හැකි අයුරින් නර්ථන අංග සඳපාළියෙන් උකහා ගෙන නාට්‍යයට ඉතා උචිත අයුරින් ඒ නර්ථන කොටසද නිර්මාණය කර තිබිණ. තවද මේ නාටකයේම රජතුමාගේ ප්‍රවිශ්ඨය, නගර සෝභනියගේ ප්‍රවිශ්ඨය ආදී අවස්ථාත් නිදසුන් ලෙස විදහාලිය හැකිය.

සරච්චන්ද්‍රයන්ගේ, දයානන්ද ගුණවර්ධනයන්ගේ සහ තවත් නිර්මාණකරුවන් රැසකගේත් නාට්‍ය ගණනාවකින් මෙවන් නිදසුන් පෙන්වාලිය හැකිය. මේ නිදසුන් තුළින් ඉස්මතු කර ගතයුතු වැදගත් කරුණු කීපයකි.

ඉන් එක් කරුණක් නාට්‍ය උදෙසා නර්ථනයක් නිර්මාණය කිරීමේදී එම ශිල්පියා නිර්මාණශීලි අයකු වන්නා සේම නර්ථන සම්ප්‍රදායන්ගේ දැනුමින් පිරිපු-න් අයකුවීම අවසන් ඵලයට මහඟු රුකුලක් වන්නේය.

කෙතරම් දැනුමින් නිර්මාණශිලීත්වයෙන් යුතු වුවද නාට්‍යයට හානියක් නොවී නාට්‍යයට එළියක් ලැබෙන ආකාරයට සමබරතාවය පවත්වා ගැනීමේ විනය නිර්මාණ ශිල්පීන් ඇති කරගත යුතුය. කෘතියේ අවසන් රූපය අධ්‍යක්ෂකගේ රූපයයි. ඒ රූපයට දායකවීම විනා ඊට හානි නොකළ යුතුය.

නලුවකු දක්ෂ රංග ශිල්පියකු වූ පමණින් සැමවිටම දක්ෂ නර්ථන ශිල්පීන් නොවන්නේය. මෙය නර්ථන නිර්මාණ ශිල්පියා අවධානය යොමුකළ යුතු සුවිශේෂ කරුණකි. ඒ මන්දයත්, නර්ථන නිර්මාපක නිර්මාණය කරන නර්ථනයන් නලුවාට සිදුකල නොහැකි නම් චරිතයට හානිකර වන්නා සේම සමස්ථ කෘතියටම එය බලපානු ඇත. අප ලද අත්දැකීම් තුළ නලු නිළියන්ගේ නොහැකියාව නිසා නර්ථන නිර්මාණයන් වෙනස්කම්වලට බඳුන් කල අවස්ථා බොහෝය. නලු නිළියන්ගේ පරාසයන්ටද සිරවී නාට්‍යයටද සාධාරණයක් සිදුවන ආකාරයට නර්ථන නිර්මාණය කිරීම එතරම් ලෙහෙසි කාර්යයක් නොවන්නේය.

ඇතැම් විට දක්ෂ නර්ථන ශිල්පීන් නලුවන් ලෙසත්, චරිතයන්ට පණ පොවන අවස්ථාද හමුවනු ඇත. එවන් අවස්ථාවල චරිතය අභිබවා නලුවා තුළින් නර්ථනයන් මතුවූ අයුරු අප දැක ඇත. මෑත කාලීනව මනමේ කුමරු චරිතයට පණපෙවූ අප මිතුරු සුනිල් සොයුරා දක්ෂ උඩරට නර්ථන ශිල්පියෙකි. ඔහු පුහුණුවීම ඇරඹූ මුල් වකවානුවේ චරිතය අභිබවා ඔහුගේ නර්ථනයන් ඉස්මතු වූ අයුරු අප දුටුවෙමු.

එය චරිතයට හානිකර නොවන ආක-ාරයට සමබරතාවයකට රැගෙන ඒමට ඔහුට දැඩි උත්සහායක් දැරීමට සිදුවිය. නාට්‍යයට සරිලන සේ නර්ථනය සමබර කර ගැනීම නලුවාගේ, නර්ථන නිර්මාපකවරයාගේ මෙන්ම අධ්‍යක්ෂකවරයාගේද වගකීමක් වන්නේය.

නාට්‍යයක නලුවරණය වූ කලී ඉදිරි ගැටලු මුලින්ම මඟහරවා ගතහැකි මොහොතකි. පෙළට අනුකූලව නර්ථන රැසකින් යුතු නාට්‍යයක් නම් නලුවරණයේදී නර්ථන නිර්මාපකගේ සහායද දායකත්වයද ලබා ගැනීම උචිත වනු ඇත. චරිතයට නිසි නලුවා තෝරා ගැනීමෙන් අනාගත ගැටලු රැසක් මඟහරවා ගත හැක.

නාට්‍යයකට නර්ථන නිර්මාණය පිළිබඳව සරලව සාකච්ඡාවට ලක්කළ මේ ලිපියේ සාරාංශය මෙසේ සටහන් කිරීම නිවැරදි යැයි සිතමු.

නාට්‍යයක් උදෙසා නර්ථනය නිර්මාණය කිරීම මතුපිටින් පෙනෙන තරම් ලෙහෙසි කර්තව්‍යයක් නො-වන්නේය. එසේම දැනුමින් පිරි සංයමයකින් යුතු නිර්මාණශිලී නිර්මාපකයකුට එතරම් අපහසු කර්තව්‍යයක් ද නොවන්නේය.

නාට්‍යයක් උදෙසා නර්ථන නිර්මාණය, නාට්‍ය කලාව, නර්ථන කලාව ගැන දැන උගත් හෝ නූගත් බොහෝ පිරිසක් විසින් සිදුකරන්නකි. එහි සාර්ථක බව හෝ අසාර්ථක බව නිර්මාපකයාගේ දැනුම සහ නිර්මාණශිලීත්වය මත පිළිබිඹු වන්නකි.

නිර්මාපකවරයා කෙතරම් දක්ෂ වුවද එය ප්‍රේක්ෂකයා වෙත ගෙනයන නලුවා මත එහි වැඩි වගකීමක් පතිත වනු ඇත.

මේ සියලු ශිල්පීන්ගේ දායකත්වය සමබර කොට නාට්‍යයට දායක කොට ගැනීමේ පූර්ණ වගකීම අධ්‍යක්ෂකවරයා සතුය.

VCE
Chemistry, Biology & Maths
**Tuition**
Offered by an
Australian Qualified & Experienced Teacher

Sandya De Silva
(B. Sc., M.Sc. Dip.Ed.)

Tel: 9437 7801
Mobile: 0402 503 398
**REGISTERED TEACHER OF**
**THE VICTORIAN INSTITUTE OF TEACHING**